# "පාරිසරික ගැටලු, සන්නිවේදනය සහ ජනමාධ්‍ය භාවිතය"

(පුවත්පතට විශේෂිතව කෙරෙන අධ්‍යයනයක්)


ලියාපදිංචි අංකය : FGS/MACO/MC/08/004

නම : එල්. එල්. ඩී. දුනීෂා මනෝරි



| | |
|---|---|
| ප්‍රවේශ අංකය: | 1176 |
| වර්ග අංකය: | |


ශ්‍රී ලංකා කැලණිය විශ්වවිද්‍යාලයේ, පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයේ ජනසන්නිවේදනය සමාජීයවිද්‍යාපති උපාධිය සඳහා ඉදිරිපත් කරනු ලබන ස්වාධීන පර්යේෂණ නිබන්ධයයි.

2008/2009

## සාරාංශය

පාරිසරික ගැටලු සන්නිවේදනය සම ජනමාධ්‍ය භාවිතය නම් මෙම පර්යේෂණ නිබන්ධනය පුවත්පතට විශේෂිතව කෙරෙන අධ්‍යයනයකි. ඒ සඳහා 2009 වර්ෂය පුරා පළවූ සති අන්ත සිංහල මාධ්‍ය සිළුමිණ හා ලංකාදීප පුවත්පත් 104ක් තෝරාගෙන තිබේ.

පරිසර ගැටළු අද ලෝකය පුරාම ප්‍රබල ලෙස ව්‍යාප්ත වී තිබේ. මිනිසා පරිසරය කෙරෙහි දක්වන අහිතකර බලපෑමද වැඩි වී තිබේ. ඒ නිසා පරිසර ගැටලු ප්‍රබල අරබුද බවට පත් විමට පෙර මිනිස් ඇස යොමු කරවිමට සන්නිවේදන කාර්යය ශක්තිමත් විය යුතු වේ. මෙ සඳහා රටේ ජන මාධ්‍ය ආයතන වලට සහ ජනමාධ්‍යවේදින්ට ප්‍රබල බලපෑමක් සිදු කළ හැකිය.

මේ අනුව පුවත්පත් මධ්‍ය තුළින් ලංකාවේ පරිසර ගැටලු සන්නිවේදනය කිරීමෙහිලා දක්වන දායකත්වය කෙබඳු ස්රූපයක් ගනීද යන්න වැඩිපුර විමර්ශනයට ලක්කෙරේ. පර්යේෂණයේ කෘතිය තුළින් හැඳින්වීම පර්යේෂණ ගැටලුව, පර්යේෂණ අරමුණු, උපන්‍යාස, පූර්වසාහිත්‍ය විමර්ශනය, පර්යේෂණ සීමා සහ අධ්‍යනයේ වැදගත්කම යනාදී කරුණු විමසුමට ලක් කෙරේ. අනතුරුව අධ්‍යතන පාරිසරික ගැටලු කිහිපයක් විමසා බැලෙන අතර ඒවායේ මෑත කාලීන උපනතීන් සහ පරිසරය හා පරිසර විද්‍යාව පිළිබඳ මතවාද හා සංකල්ප විග්‍රහයන්ද ඉදිරිපත් කෙරේ. පරිසර සන්නිවේදනයේ නව ප්‍රවණතාවයන් හඳුනාගැනීමත් ජනමාධ්‍ය ආයතන ඒ පිළිබඳ ද ගෙන ඇති නව ක්‍රියාදාමයන් පළිබඳ කරුණු විමසා බැලේ.

පර්යේෂණ වාර්තාව, දත්ත විශ්ලේෂණය, නිගමන සහ යෝජනා ද සහිතව ආශ්‍රිතග්‍රන්ථ හා උපග්‍රන්ථ දන්වමින් න්බන්ධනයේ කටයුතු සම්පූර්ණ කර ඇත.

විශෙෂයෙන්

- පරිසරය
- පරිසර සන්නිවේදනය
- පරිසර ගැටලු
- ජනමාධ්‍ය ආයතන
- හරිත සංකල්පය

යන ප්‍රධාන කරුණු විමර්ශනයට ලක් කෙරේ.

## An Abstact

This is a very special thesis about a study of environmental problems, communication and media.

To fulfill this study, there are 104 weekend Sinhala news papers of "Sri Lankadeepa and Silumina have selected which have published through out the year 2009.

The enverenment problems have spreaded allover the world today. The harmful effects which has done to the enverenment by the man has increasing day by day. Therefore the media should be strengthan to keep an eye on that before becoming the problems into conflicts The journalists and media oan do a strong influence to fulfill the problem.

According to that, Newspapers contribution on solving problem of environment and review their nature will be considerd in Sri Lanka

Through this experimental book, following topics will be presented,

The are;

Introduction ,Experimental of the problems, Objectives of the Experiment, Sub theory, Review of the pre - litterer, Limits of the Experiment, Importance of the study

After words the recent enverenmental problem will be considered. Then it presents the ideology on Environment and Ecology and the concept of reviews

By identifying the new tendency of Environment communication, it will be considered the processes which media institution have taken to solve this problem.

The thesis has completed the experimental report, Data analysis and conclusion with suggesions using, volumes and sub volumes specially it includes; Environment , Environmental Communication , Environmental problems, Mass Media, Green concept

They all have taken in to consideration